**ආචාර්ය අජිත් සී.එස්.පෙරේරා එ. නීතිපති සහ තවත් අය**

ජේ.ඒ.එන්. ද සිල්වා අගවිනිසුරුතුමා,

අමරතුංග විනිසුරුතුමා,

ශ්‍රීපවන් විනිසුරුතුමා

නඩු අංකය: S.C. (FR) NO. 221/2009

27.04.2011

මෙම නඩුව 2009ක්වූ 10 වන මස 14 වන දිනැති තීන්දුව තවදුරටත් පැහැදිලි කිරීමේ අරමුණින් කැඳවනු ලැබේ.

සියලු පාර්ශවයන්ගේ තර්ක විමසීමෙන් අනතුරුව, 2009ක්වූ 10 වන මස 14 වන දින ලබා දෙන ලද තීන්දුව අධිකරණය විසින් මතු සඳහන් තීන්දුවෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ:

මිනිසුන්ට නිදහසේ සංචරණයේ හැකියාවේ විවිධ මට්ටම් පවතින බව මෙම අධිකරණය පිළිගන්නා අතරම, ඉතා විශාල සංඛ්‍යාවක් විශේෂයෙන්ම වැඩිවෙමින් පවතින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ආබාධ සහිත තැනැත්තන් හා ගර්භණී මවුවරුන් යාම් ඊම් වලදී සීමාවලට මුහුණ දෙන බව ද මෙම අධිකරණය පිළිගනියි.

එසේම, සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත හා එම පනත යටතේ පනවනු ලැබ ඇති රෙගුලාසි ප්‍රකාරව කිසිඳු තැනැත්තෙක් තමාගේ ආබාධ සහිත භාවය යන පදනම මත වෙනස්කොට සැලකීමකට ලක් නොවිය යුතු අතර එම තත්වය හේතුවෙන් එදිනෙදා ජීවිතයේ දී මානව-නිර්මිත පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා එම ස්ථාන වල සපයා ඇති පහසුකම් වෙත ප්‍රවේශ වීමේ, ආරක්ෂාවේ හා වාසය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට වන සහජ අයිතිය සමානව භුක්ති විඳීමට බාධා වන අයුරින් ඔවුන්ගේ සංචරණය සීමා නොකළ යුත්තේය.

ඒ අනුව, මෙතැන්සිට සියලුම නව පොදු ගොඩනැගිලි හා පොදු ස්ථාන විශේෂයෙන් වැසිකිළි හා සේදීම් පහසුකම් සලසන ස්ථානයන් සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ පනවනු ලැබ ඇති 2006 අංක 01 දරණ ප්‍රවේශය සම්බන්ධ රෙගුලාසීන්හි අර්ථ දක්වා ඇති ආකාරයට දැනට බලාත්මක රෙගුලාසීන්හි 'සැලසුම් අවශ්‍යතා'වන්ට අනුකූල වන ආකාරයෙන් සැලසුම් කිරීම හා ඉදිකිරීම කල යුතු බව මෙම අධිකරණය විසින් තවදුරටත් නියෝග කෙරේ.

එසේම, ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා, ඉදිකිරීම අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගැනීම හා ඉදිකිරීම් අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා මෙම අධිකරණ නියෝගයට අනුකූලව ක්‍රියාකිරීම අනිවාර්ය වේ. එබැවින් එම බලතල ක්‍රියාත්මක කරන සියලුම බලාධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් සමාන වගකීමක් දරන ගොඩනැගිලි හිමිකරුවන් ද සමඟ මෙම නියෝගය උල්ලංඝනය කරන සියලු නව ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉහත එසේ කිරීමෙන් වැළකී සිටිය යුතුය.

මෙම අධිකරණ තීන්දුව අනුගමනය කිරීමට අපොහොසත් වීම දඬුවම් ලැබිය හැකි බරපතල වරදක් වන අතර නීතියෙන් දක්වා ඇති ආකාරයේ දඬුවම් වලට යටත් වීමට සිදු වේ.

මෙම නඩු කටයුතු මෙයින් අවසන් කරනු ලැබේ. පසුව අලුතින් සිදු වන උල්ලංඝනයකදී එම තත්වය සම්බන්ධයෙන් එම අවස්ථාවේදී කටයුතු කරනු ලැබේ.